සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province


**06 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2023(2024)** | **32 S I,II**

නම: ..........................................   **ගණිතය**   **කාලය පැය දෙකයි**

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

## A - කොටස


01. අඳුරු කළ කොටස මුළු රූපයේ භාගයක් ලෙස දක්වන්න.



.............................   .............................

02. 3584 යන සංඛ්‍යාවේ 8 න් නිරූපිත අගය 4 හි නිරූපිත අගය මෙන් කවර ගුණයක් වේද?

03. මෙම පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුව කුමක් ද?



04. පන්තියක සිසුන් ගණන ආසන්න 10 ට වටැයූ විට 40 වේ නම්, පන්තියේ සිටිය,
   i. උපරිම සිසුන් ගණන - ..........................................
   ii. අවම සිසුන් ගණන - ..........................................

05. 7 : 5 ට තුල්‍ය අනුපාත දෙකක් ලියන්න.


06. $\frac{3}{4}$ , $\frac{3}{7}$ $\frac{3}{5}$ යන භාග ආරෝහණ පිළිවෙලට ලියන්න.

07.

| භාග සංඛ්‍යාව | දශම සංඛ්‍යාව |
| --- | --- |
| $\frac{7}{10}$ | ................ |
| .......... | 0.35 |

08. පොත් රාක්කයක පොත් 480 ක් සමානව තට්ටුවල අසුරා ඇත. එක් තට්ටුවක පොත් 96 ක් ඇත්නම් රාක්කයේ තට්ටු ගණන කොපමණද?

09.





තිරස් තලය හා සිරස් තලය මැනීමට භාවිතා කළ හැකි උපකරණ දෙකක් A හා B ලෙස දක්වේ. A හා B උපකරණ නම් කරන්න.

A - ...........................................................

B - ...........................................................


10. තුන් මිලියන හාරසියය ඉලක්කමෙන් ලියන්න.

11.




භාජන දෙකෙහි ද්‍රව ප්‍රමාණ සමාන වීමට
A භාජනයෙන් B භාජනයට දැමිය යුතු ද්‍රව ප්‍රමාණය කොපමණද?

12.




i. වෘත්තය මත පිහිටීම දක්වන අක්ෂරය
ii. වෘත්තය තුළ පිහිටීම දක්වන අක්ෂරය

13. හිස්තැන් වලට අදාළ ගණිත කර්ම යොදන්න.

20 ........ 4 ........... 20 = 100

14. අඹ ගෙඩියක මිල රු. $x$ ද දොඩම් ගෙඩියක මිල රු. 75 ක් ද නම් අඹ ගෙඩියක් හා දොඩම් ගෙඩියක් සඳහා වැයවන මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

15. පහත සමූහ සඳහා ගැළපෙන නම ලියන්න.

i. 1 3 6 10 ................................

ii. 1 4 9 16 ................................

16. සමචතුරස්‍රයක හා රොම්බසයක දැකිය හැකි සමාන ලක්ෂණයක් හා අසමාන ලක්ෂණයක් බැගින් ලියන්න.

i. සමාන ලක්ෂණය : ................................................................................................

ii. අසමාන ලක්ෂණය : ................................................................................................

17. පහත සංඛ්‍යා අතුරින් ප්‍රථමක නොවන සංඛ්‍යා තෝරන්න.

7 9 11 17 21 23

18. තේ කුඩු 500 g කින් කුඩා පැකට් 10 ක් සෑදිය හැකිය. 4 kg කින් සෑදිය හැකි එවැනි පැකට් ගණන කොපමණද?


19. 4 7 3 5 යන සංඛ්‍යා සියල්ල යොදාගෙන එකස්ථානය 7 වන ලෙස ලිවිය හැකි විශාලම සංඛ්‍යාව ලියන්න.

20. අගය සොයන්න.

17.3 - 8.25

## II කොටස

(01) පහත සංඛ්‍යා රටාවට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. ii. iii. iv.

i. මෙම සංඛ්‍යා රටාව හඳුන්වන නම කුමක් ද?
ii. මෙම රටාවට අනුව හයවන රටාවේ ඇති තිත් ගණන කොපමණද?
iii. අවසාන රටාවේ තිත් 49 ක් තිබේ නම් එක් පැත්තක ඇති තිත් ගණන කොපමණ ද?
iv. තුන්වන සහ හතර වන රටාවල ඇති තිත් ගණන භාවිත කර මෙවැනිම රටාවක් සෑදිය හැකි නම් එය මෙම රටාවේ කී වැනි රටාවේ ද?


(02) පහත දැක්වෙන සංඛ්‍යා සුළු කිරීමේ දී හිස් කොටු වලට අදාළ සංඛ්‍යා ලියන්න.

i.
```
   □47
 □821
  90□
 5273
```

ii.
```
  □54
 × □3
  762
 5□8
 5842
```

iii. පොතක මිල රු. 80 ක් නම් රු. 1200 කට ගත හැකි පොත් ගණන කොපමණද ?
iv. සැමන් ටින් එකක මිල රු. 500 ක් නම් එවැනි ටින් 10 ක් අඩංගු පෙට්ටි 10 ක මිල සොයන්න.

(03) නගර කිහිපයක පෙ.ව. 6.00 වන විට පැවති උෂ්ණත්වය පහත සංඛ්‍යා රේඛාව මඟින් නිරූපණය කර ඇත.




උෂ්ණත්වය සෙල්සියස් වලින් දක්වා ඇත.

i. අඩුම උෂ්ණත්වය පැවති නගරය කුමක් ද?
ii. වැඩිම උෂ්ණත්වයක් පැවති නගරය කුමක් ද?
iii. ටෝකියෝ සහ පීකිං යන නගර අතර උෂ්ණත්වයේ වෙනස කොපමණද ?
iv. සෙල්සියස් අංශක "0" ට වඩා අඩු උෂ්ණත්වයක් ඇති නගර ලියා දක්වන්න.


(04) ලෝක ළමා දින වැඩ සටහනක විස්තරයක් පහත දැක්වේ.

1. පෙ.ව. 7.30 - පාසල ආරම්භය
2. පෙ.ව. 8.00 - ළමා දිනය පිළිබඳව විස්තර කිරීම.
3. පෙ.ව. 8.20 - ආරාධිත අමුත්තාගේ කතාව
4. පෙ.ව. 9.00 - ළමා විශේෂාංග ඉදිරිපත් කිරීම.
5. පෙ.ව. 9.40 - ළමා ක්‍රීඩා තරඟ පැවැත්වීම
6. පෙ.ව. 11.30 - වැඩ සටහන නිමාව

i. ළමා දිනය පිළිබඳ විස්තර කළ කාලය කොපමණද ?
ii. වැඩි වේලාවක් ගත වී ඇත්තේ කුමන කාර්යය සඳහා ද?
iii. වැඩ සටහන පැවති මුළු කාලය කොපමණ ද?
iv. ක්‍රීඩා තරඟ පැය දෙකක කාලයක් පැවතියේ නම් වැඩසටහන නිමාවන වේලාව කීයද?

(05) පහත රාමුව තුළ ඇති සතුන් පොදු ලක්ෂණයන් අනුව කාණ්ඩ තුනකට වෙන් කරන්න.




i. 

A B C

ii. එක් එක් කාණ්ඩ සඳහා ඔබ තෝරාගත් පොදු ලක්ෂණය ලියන්න.


A
B
C

iii. පහත දැක්වෙන කාණ්ඩයට අදාළ ද්‍රව්‍ය 3 ක් සඳහන් කරන්න.

1. පළතුරු

iv. වයලීනය , බටනලාව , ගිටාරය යන භාණ්ඩ සඳහා යෙදිය හැකි පොදු ලක්ෂණය කුමක් ද?

(06) බීම වර්ගයක් පුරවා ඇති භාජනයක් ($6\,l$) සහ ධාරිතාව සටහන් කරන ලද හිස් භාජන 3 ක් පහත දැක්වේ.




i. බීම ප්‍රමාණයේ ධාරිතාව *ml* වලින් දක්වන්න.
ii. C භාජනයේ ධාරිතාව එක් අයෙකුට සෑහේ නම් මුළු බීම ප්‍රමාණය කී දෙනෙකුට දිය හැකිද?
iii. මුළු බීම ප්‍රමාණය A භාජනය මෙන් භාජන කොපමණ ප්‍රමාණයක් පිරවිය හැකිද?
iv. බීම ප්‍රමාණය A,B හා C භාජන වල ධාරිතාව මෙන් කවර ගුණයක් ද?

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**